# බටහිරයන්ගේ පෙරදිග

බටහිර සමාජයීය විද්‍යාඥයන් ගේ දැනුම සමාජයීය නිර්මිතයක් ය යන්න සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ගොඩනැගිය හැකි ව තිබූ ඥානවිභාගය තරම් ගැඹුරු අදහසක් නොවූවත් එහි මූලික වැදගත්කමක් වෙයි. බටහිර සමාජයෙහි වාස්තවිකත්වය, යථාර්ථය ආදී සංකල්පවලට තිබූ ආධිපත්‍යය සුළුවෙන් හෝ දුර්වලවීමක් එමගින් සිදු විය. උදාහරණයක් වශයෙන් ගත හොත් අද බටහිර ඇතැම් උගතුන් අතර මහත් සම්භාවනාවට පත් වූ කෘතියක් වන එඩ්වඩ් සයිඩ් විද්වතාගේ ප්‍රාචීනවාදය (Orientalism)- නම් කෘතියෙන් කියැවෙන්නේ පෙරදිග ගැන බටහිරඩියන් ඇති කරගෙන තිබූ දැනුමක් ඇති බවත් එය පෙරදිග නො වන බවත් ය. බටහිරයන් ඉන්දියානුවා, චීන ජාතිකයා ආදී වශයෙන් කියන්නේ ඔවුන්, එනම් බටහිරයන් විසින් නිර්මාණය කෙර ඇති ඉන්දියානුවකුට හෝ චීන ජාතිකයකුට හෝ මිස ඉන්දියානුවන් ගේ ඉන්දියානුවකුට හෝ චීන ජාතිකයන් ගේ චීන ජාතිකයකුට හෝ නො වන බව ප්‍රචීනවාදය නම් කෘතියෙහි කියැවෙන මූලික අදහස ය.

සයිඩ් විද්වතා හා වෙනත් අය ගේ මතය වනුයේ බොහෝ උගත් පෙරදිග ජනයා ද බටහිරයන් විසින් නිර්මාණය කෙර ඇති පෙරදිග හා පෙරදිග වැසියා පිළිබඳ චිත්‍රය හිසින් දරාගෙන ඇති බව ය. එයට හේතුව උගතුන් යනු බටහිර අධ්‍යාපනය විසින් බිහි කෙරුණු උගතුන් වීම ය. බටහිර අධ්‍යාපනය විසින් බිහි කෙර ඇති පෙරදිග රටවල උපත ලැබූ උගතුන්ට ලැබෙන්නේ බටහිර ආකල්ප හා මතිමතාන්තර ය. පෙරදිග රටක උපත ලැබූ උගතාට ද පෙරදිග ගැන ඇත්තේ බටහිරයන් විසින් දී ඇත් අදහස් ය. එවිට පෙරදිග උපත ලැබූ උගතා වුව ද පෙරදිග යැයි කියන්නේ බටහිරයන් විසින් නිර්මාණය කෙරි ඇති පෙරදිගකට ය.

බටහිරයන් විසින් නිර්මාණය කෙර ඇති පෙරදිග ගුඪ ය. එහි හේතුවාදී ව තේරුම්ගත නොහැකි ය යන ආකාරයේ අදහසක් ඇත. පෙරදිග ගුඪ යැයි බටහිරයන්ං ගෙන් ඉගෙන ගන්නා ආසියාවේ උගතකු එයට ප්‍රතිචාර දක්වන ක්‍රම කිහිපයක් වෙයි. ඇතමකු බටහිරයන් අනුව යමින් පෙරදිග ගුඪ යැයි කියනු ඇත. තවත් අයකු පෙරදිග ගුඪ නැතැයි බටහිරයන්ට පෙන්වා දීමට යත්න දරනු ඇත. එහි දී එවැන්නන් උත්සාහ ගනු ඇත්තේ බටහිරයන් දකින ආකාරයට ගුඪ බව හා ගුඪ නො වන බව ගෙන පෙරදිග ගුඪකමක් නැති බව බටහිරයන් ගේ අර්ථකථන, නිර්වචන අනුව පෙන්වා දීමට උත්සාහ කිරම ය. බටහිරයන් ගේ හේතුවාදය පෙරදිග ද ඇති බව බටහිර මිනුම්දණ්ඩ අනුව ම පෙන්වීම ඔවුන් ගේ අරමුණ වෙයි. ලංකාව සම්බන්ධයෙන් ගත් කල මාර්ටින් වික්‍රමසිංහ මහතා සිංහල සංස්කෘතිය ගුඪ නො වන බව තේරුම් කිරමට පොදුවේ උත්සාහ කෙළේ ය.

තවත් සමහරු බටහිරයන් පෙරදිග ඇතැයි කියන ගුඪත්වය මතුපිටින් ගත් කල තිබෙ යැයි පිළිගෙන එහෙත් එය ගුඪ බවක් නොවන්නේ යැයි පෙන්වීමට උත්සාහ ගනිති. උදාහරණයක් ලෙස බෝධි පූජාව යම් ආකාරයක චිත්ත තරංග ආශ්‍රයෙන් තේරුම් කිරමට ගන්නා උත්සාහය දැක්විය හැකි ය. බටහිරයන්ට ගස්වලට වැඳීම අතාර්කික වූවකි. ඒ ඔස්සේ යම් යම් සහන ලබා ගැනීමක් ගැන කතා කිරම වුව ගුඪ අත්දැකීමකි. බටහිරින් යම් යම් දැ උගත් සමහරු බෝධිපූජා මගින් ලබන සහන බටහිර දැනුම ඔස්සේ ම තහවුරු කිරමට උත්සාහ දරති.

එහි දී ඔවුහු බොහෝ විට බටහිර විද්‍යාවේ සංකල්ප යොදාගනිති. තරංග යනු බටහිර විද්‍යාව විසින් යොදාගැනෙන සංකල්පයකි. බෝධි පූජාවේ දී නිකුත් කෙරෙන මානසික තරංග ගැන කතා කරන්නෝ වෙති. මේ තරංග මගින් බෝධි පූජාව කරන තැනැත්තා අනෙක් තැනැත්තකුට යම් ශක්තියක් ලබා දෙන්නේ යැයි කියැවෙයි. මෙවැනි ඊනියා ප්‍රවාද මගින් කිසිවක් තේරුම් නො කෙරෙයි. බටහිර විද්‍යාවේ කියැවෙන නොයෙකුත් ආකාරයේ තරංග හා මානසික තරංග අතර ඇති සම්බන්ධය කුමක් ද? මානසික තරංග විද්‍යුත් චුම්බක තරංග මෙන් ද එසේත් නැත්නම් ශබ්ද තරංග මෙන් ද? එසේත් නැත්නම් ඒ තරංග හා ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි කියැවෙන තරංග අතර සම්බන්ධයක් වේ ද? මානසික තරංගවලට ප්‍රචාරණය වීම සඳහා මාධ්‍යයක් අවශ්‍ය වේ ද? ඒ තරංගවලට ආයාම දිගක්, සංඛ්‍යාතයක් වේ ද?

© Prof. Nalin De Silva

මෙවැනි ප්‍රශ්න රාශියකට පිළිතුර නො දී හෝ අඩු තරමින් එවැනි ප්‍රශ්න ඇති බව වත් නොසලකමින් තරංග සංකල්පය බෝධි පූජාව තේරුම් කර දීම සඳහා යොදා ගැනීම කිසිසේත් ම අනුමත කළ නොහැකි ය. බටහිර විද්‍යාවේ කියැවෙන සංකල්ප නිසි ලෙස හැදෑරීමකින් තොර ව ඒවා ඉතා ලිහිල් ආකාරයකින් අඩු ම තරමින් ඒ ගැන පැහැදිලි කිරමකින් තොර ව යොදා ගැනීම තදබල වරදක් වෙයි. බෝධි පූජාව කරන තැනැත්තා හා ඉන් සහනයක් බලාපොරොත්තු වන්නා දෙදෙනකු වූ කල යම් ආකාරයක සන්නිවේදනයක් දෙදෙනා අතර අවශ්‍ය වේ යැයි සිතන බවත් බෝධි පූජාව කරන තැනැත්තා ගේ සිතිවිලිවල ශක්තිය අනෙක් තැනැත්තකු කරා ගෙන යෑම පිළිබඳ ප්‍රශ්නය විසඳාගත යුතු ව ඇති බවත් ඉහත සඳහන් ආකාරයෙන් කල්පනා කරන්නන් සිතන බවක් පෙනෙයි. ඔවුන් ඒ සඳහා යොදා ගන්නේ තරංග ආකෘතිය ය. මෙය ඒ ප්‍රවාදය නිර්මාණය කිරමට උත්සාහ කරන්නන් තේරුම් නොගත්ත ද බටහිරයන්ට අප අතර ගුඪත්වයක් නැතැයි කීමට ගන්නා උත්සාහයක් පමණක් වෙයි.

මේ පුද්ගලයන් අපේ ඊනියා ගුඪත්වයක් නැතැ යි කීමට යොදා ගන්නේ බටහිර ප්‍රවාදයක් හරිහැටි අධ්‍යයනය නො කර ඉන් ලබාගන්නා වචනයක් දෙකක් පමණකි. මේ පුද්ගලයන් ගෙන් ඇතැම්හු ජාතිකත්ව මතවාදයකට ද පක්ෂපාතී වීමට ඉඩකඩ ඇත. එහෙත් එපමණකින් ඔවුන් කරන වරදෙහි බර අඩු නො වෙයි. ඔවුහු බටහිරයන් අප අතර වේ යැයි කියන ඊනියා ගුඪත්වය නැතැයි කීමට බටහිරයන් ගේ ම ප්‍රවාද හරි අවබෝධයකින් තොර ව යොදා ගැනීමට ගොස් අවුලක පැටලෙති.

අප පළමුවෙන් ම සඳහන් කළ කණ්ඩායම බටහිරයන් ගේ ඇසින් ම අපේ දෑ දැකීමට උත්සාහ ගනියි. එපමණක් නො ව ඔවුන්ට අනුව බටහිර දැනුම නොදන්නා අය හෝ ඒ යොදා නොගන්නා අය හෝ ළිං මැඩියෝ වෙති. එහෙත් බටහිර දැනුමෙන් අපේ ප්‍රශ්නවලට විසඳුම් වේ දැයි ඔවුහු නො දනිති. ඔවුන් සිතන්නේ නම් අපේ ප්‍රශ්නවලට විසඳුම් බටහිර දැනුමේ ඇත කියා ය. සයිඩ් විද්වතා ගේ කෘතිය ගැන සමහර විට අසා තිබුණ ද, ඇතැමුන් ඒ කියවා තිබුණ ද, බටහිරයන් විසින් පෙරදිග පිළිබඳ ව ද කෙර ඇත්තේ දැනුමක් නිර්මාණය කිරමක් පමණක් බව ඔවුහු නො දනිති. ඇතැමුන් ඊනියා කියවීම් ගැන කිනම් ආකාරයකට මැත දෙඩෙව්ව ද, පෙරදිග ගැන ද, බටහිරයන්ට ඇත්තේ ඊනියා කියවීමක් පමණක් බව ඔවුන්ට නො තේරෙයි.

මේ බොරු කියවීම ආදී වචන අපට අවශ්‍ය නැත. ඊනියා කියවීම යන සංකල්පය ද බටහිරයන් ගේ ම දැනුමෙහි කොටසක් වෙයි. වෙනත් අයුරකින් කියන්නේ නම් කියවීම යන්න ද කියවීමකි. අප යොදාගන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාව යන වචන ය. සයිඩ් විද්වතා තම ප්‍රාචීනවාදය නම් කෘතියෙන් කියන්නේ පෙරදිග පිළිබඳ ව දැනුමක් බටහිරයන් විසින් නිර්මාණය කෙරී ඇති බව ය. ඒ දැනුම එලෙස ගත් කල සමාජයීය නිර්මිතයකි. එහෙත් අපි එතැනින් නො නවතිමු. එලෙස නිර්මාණය කෙරෙන දැනුම සාපේක්ෂ බව ද අපි කියමු. සමාජයීය නිර්මිත දැනුම නිර්මාණය කෙරෙන්නේ කෙසේ දැ යි බටහිරයෝ නො කියති. ඒ දැනුම නිර්මාණය කෙරෙන්නේ අවිද්‍යාව නිසා බවත් ඒ දැනුම සංස්කෘතියට (හා මනසට හා ඉන්ද්‍රිය පද්ධතියට) සාපේක්ෂ ව නිර්මාණය කෙරෙන බවත් අපි කියමු.

එහි දී කිව යුතු තවත් කරුණක් ද වෙයි. එනම් ඒ හුදු සාපේක්ෂතාවක් නො වන බව ය. බටහිරයන් පෙරදිග ගැනත් කියන විට ඒ ඔවුන් පෙරදිග ගැන නිර්මාණය කර ඇති දැනුම බව අපි කියමු. එහෙත් ප්‍රශ්නය වනුයේ එසේ නිර්මාණය නො වූ පෙරදිගක් ඇත් ද යන්න ය. වෙනත් වචනවලින් කියන්නේ නම් වාස්තවික වූ ද යථාර්ථයක් වූ ද පෙරදිගක් තිබේ ද? ඒ ප්‍රශ්නයට අප දෙන පිළිතුර නම් එවැනි වාස්තවික යථාර්ථයක් වූ පෙරදිගක් නැති බව ය. පෙරදිග ගැන පෙරදිග වැසියන්ට ඇත්තේ ද ඔවුන් විසින් නිර්මාණය කෙර ඇති දැනුමක් මිස වාස්තවික දැනුමක් නො වෙයි.

මෙයින් කියැවෙන්නේ සැබෑ පෙරදිගක් යනුවෙන් පෙරදිගක් නැති බව ය. පෙරදිගයන් ගේ පෙරදිග ද නිර්මාණයකි. ඒ ඔවුන්ට සාපේක්ෂ වෙයි. බටහිරයෝ එලෙස නො ගනිති. ඔවුන්ට කොහේ හෝ ඊනියා සැබෑ පෙරදිගක් තිබිය යුතු ය. සාපේක්ෂතාව නිර්මාණයෙන් හා නිර්මාණය සාපේක්ෂතාවෙන් වෙන් කළ විට එවැනි තත්ත්වයක් ඇති වෙයි. අයින්ස්ටයින් විද්වතා ගේ සාපේක්ෂතාවාදයෙහි නිර්මාණයක් නො වෙයි. එහි වාස්තවික වූ යථාර්ථයක් ඒ ඒ නිරක්ෂකයා සාපේක්ෂ ව නිරක්ෂණය කරයි. සැබෑ වස්තුව නිරක්ෂණය කරන්නේ වස්තුව සමඟ චලනය වන නිරක්ෂකයා ය. ඒ නිරක්ෂකයා වස්තුවේ නියම දිග (Proper Length) මැන ගනියි. වස්තුවට සාපේක්ෂ ව

© Prof. Nalin De Silva

චලනය වන නිරීක්ෂකයන්ට මැනගත හැක්කේ වස්තුවේ සාපේක්ෂ දිග ය. ඒ ඒ නිරීක්ෂකයා තමන්ට සාපේක්ෂ ව වස්තුවේ ප්‍රවේගය අනුව ඒ ඒ සාපේක්ෂ දිග නිරීක්ෂණය කරයි. අයින්ස්ටයින් විද්වතා ගේ සාපේක්ෂතාවාදයෙන් කියැවෙන්නේ වස්තුවක ඊනියා සැබෑ ගුණ ඒ ඒ නිරීක්ෂකයා නිරීක්ෂණය කරන ආකාරය ය.

සයිඩ් විද්වතා සෘජු ව ම එසේ නොකීව ද, බටහිරයන් සැබෑ පෙරදිගක් තිබිය දී ඔවුන් ගේ ම වූ පෙරදිගක් නිර්මාණය කිරමක් ගැන සඳහන් කරයි. එහි නිර්මාණයක් ගැන කතා කළ ද ඒ නිර්මාණාත්මක සාපේක්ෂතාවක් නො වෙයි. සයිඩ් විද්වතාට අනුව සැබෑ පෙරදිගක් ඇති නමුත් බටහිරයෝ වෙනත් පෙරදිගක් නිර්මාණය කරති. එය සාපේක්ෂතාවාදයෙහි දී සැබෑ දිග වෙනුවට වෙනත් දිගක් නිරීක්ෂණය කිරීමට බෙහෙවින් සමාන ය. එහෙත් අප කියන්නේ බටහිරයන් සැබෑ පෙරදිගක් නැති ව ම ඔවුන් ගේ ම වූ පෙරදිගක් නිර්මාණය කරන බව ය. එපමණක් නො ව පෙරදිගයෝ ද සැබෑ පෙරදිගක් නැති ව ම තමන් ගේ පෙරදිගක් නිර්මාණය කරති. ආත්මයක් යනුවෙන් දෙයක් නැති ව ආත්මයක් නිර්මාණය කරන මිනිසුන්ට නො කළ හැක්කේ කුමක් දැ යි යමකුට සිතෙනු ඇත. මම යනු මගේ නිර්මාණයක් මිස මගෙන් තොර ව පවත්නා මමක් මට පෙනෙන ආකාරය නො වෙයි. මනස යනු මනසේ නිර්මාණයක් යැයි අප අවසාන වශයෙන් කියන්නේ මේ සියල්ල සලකා බැලීමෙන් පසුව ය.

ක්වොන්ටම් භෞතිකයට බටහිරයන් දී ඇති යථාර්ථවාදී අර්ථකථනය මෙන් ම ඉන්ද්‍රියානුභූතවාදී කෝපන්හේගන් අර්ථකථනය ද අසාර්ථක වන්නේ පැවතීම සත්බව(ontology) පිළිබඳ ව ඔවුන්ට ඇති ගැටලුව හේතු කොට ගෙන ය. යථාර්ථවාදයට අනුව යමක් ඉන්ද්‍රියන් ගෙන් තොර ව පවතියි. ඉන්ද්‍රියානුභූතවාදීන්ට අනුව ඉන්ද්‍රියයන්ට ගෝචර දෑ පවතියි. ඔවුන්ට අනුව ඉන්ද්‍රියයන්ට ගෝචර නොවන දෑ ගැන කතා කිරම නිෂ්ඵල ය. එහෙත් නිරීක්ෂණය කළ නොහැකි අවස්ථා කිහිපයක එකවිට ඇති කැටයන ඔවුන්ට ඉවත දැමිය නොහැකි ය. මේ කැටයන වාස්තවික ව පවතින්නේ ද? නිරීක්ෂණය නොකළ හැකි එවැනි කැටයන ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍රය මෙන් ම තවත් බොරුවක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva